සිටියහ. ඇඳුමේ පාටට ගැලපෙන අයුරින් ආබරණ පළඳඳගෙන සිටියහ. හිඹස තුළදීත් උස් අඩි සහිත ඇඳුමේ වේදනාවෙන් ම යුතු පාවහන් පළඳා සිටියහ. සොහොයුරියගේ කුඩා දරුවන් දෙදෙනාගේ දෑතින් අල්ලාගෙන හිඹස තුළ එහා මෙහා ගිය ටාහනාගේ හිරාවරණය වූ දෙපා මා දෑස තුළ අපසාදයක් එදා මතුකර දෙනවා මට මතක ය.

කෙසේ වුව ද අඟේ හිඹස මා සීතා සිටියාට වඩා සුන්දර තැනකි. හිඹසේ ආලින්දයත්, එසිත්ත කාමරයත් එකිනෙකට සමාන්තරව ඉදිරිපසින් ම පිහිටා තිබුණේ හැකිතාක් දුරට ඒ හෙන්කලු වෙරළේ දර්ශනය හිඹස තුළට ඇතුල් කර ගැනීම වෙනුවෙන් වීය යුතු ය. තිර රෙදි මුලුමිනින්ම ඇත් කර තිබූ බැවින් සම්පූර්ණ ඉදිරිපස බිත්තියක සාදා තිබුණේ වීදුරුවලින් බැව් පෙනී ගියේ ය. මා තව තවත් පුදුමයට පත්කරලමින් ටාහනා මා කැඳවාගෙන ඇතැම් කාමරය වෙත ගියා ය. එය තිබුණේ ආලින්දයට පිටුපසිනි. බිත්තියක් පිරෙන්නට පාසා තිබූ පොත් අල්මාරි ගොඩ ද, පරිගණක උපකරණ සහිත කුඩා මේසය ද තවත් කොණක තබා තිබෙන දිගු සෝපාව ද එකවර මා වෙතට හසුවුව ද මා විශ්මිතව බලා සිටියේ ආලින්දය දෙසට තිබූ බිත්තිය තුළින් තරමක් මා බලාසිටින්නේ සපිරී මුහුදු වෙරළේ දසුන ම වූ බැවිනි.

''මට මේක විශ්වාස කරන්න අමාරුයි'' ''මම දැන්ගිය....'' අය සිටියේ සිහාසෙමිනි.

මම අෑ පසුකර නැවත ආලින්දයට ගියෙමි. එහි තබා තිබුණේ රන් ආලේපිත රාමුවකින් වටවුනු විශාල කණ්ණාඩියකි. එය ඇත්තෙන්ම කණ්ණාඩියක් ලෙස පෙනී යන අයුරින් තැනූ බිත්ති රාමුවකි. මේ කාගේ අදහසක් දැයි මම පුදුමයට පත් වුනෙමි.

''ලහිරු.... මම මුහුදු වෙරළට මේ තරම් ආස කරන්න පටන් ගත්තේ තාත්ත නිසයි...''
අෑ මුල පිරුවේ දිගු කතාවකට වීය යුතුය. එහෙත් අෑට එය නිමකරගැනීමට හොලැබිණි. අප අසලට පැමිණියේ අඟේ පියා ය.
''ටාහනා මට කිව්ව ඔයා ශ්‍රී ලංකාවෙන් කියලා.''
''ටාහනා කොහොමද දන්නේ මම ලංකාවෙන් කියලා''

මේ කෙල්ල පිළිබඳව සුහදශීලී හැසිමිකේ මා තුළ ඇතිකර ගත හොඳකේක් මන් ද.....?

''ඇයි ඔයාලගෙ ක්‍රිකට් කණ්ඩායමේ නායකයයෙ නමින් රණතුංග නේද....''

මම සිනාසෙමි. අෑ කර ඇත්තේ සාධාරණ සැසඳීමකි.

''කොහොම උනත්... ලහිරුවරුත් කලිනුයි මම ලංකාවට ගිහින් තියෙන්නේ....'' ඒ ටාහනාගේ පියා ය.

මේ මොන හතරවැනි කතාවක් ද?

''පුදුම වෙන්න එපා.... මගේ තාත්ත හමුදාවෙ හිටපු කෙනෙක්. ඒ දවස්වල තාත්ත හොංකොංවල වැඩකලා... මම හුඟක් පුංචියි අපි ලංකාවට යනකොට....'' මා ඇත්තාට ම මහුට අෑහුම්කන් දුන්නේ පුදුමයට පත්වෙමිනි.

''මම මුලින්ම පීනන්න ඉගෙන ගත්තෙ එහෙදි තමයි.... මට දැන් හරියට ම මතක නැහැ.... උ..ණුව...ටුක. එහෙම මුහුදු වෙරළක් තියනව නේද ලංකාවෙ....?''

මේ සුදු හම සහිත විදේශිකයා මගේ රට පිළිබඳව කතාකරන්නේ කොතිතරම් ආසා-වකින්ද්දැයි මම ඇත්තෙන්ම පුදුම වුනෙමි.

ටාහනාගේ පවුලේ සාමාජිකයන් පිළිබඳව සතුටුදායක හැසිමකින් යුතු ව ඇඟේ හිඹසින් පිටව ඒමට තවත් සිදුවීමක් ඉවහල්වී ය. අපි දවල් කෑමෙන් පසුව ඔවුන්ගේ සිරිතට අනුව කෝපි තානයේ යෙදුණේ එසිත්ත කාමරයේ සිට ය. ටාහනාගේ මවත් මගේ මවට යම්තරමකට කිරිදුලෙවේ යන්නෙක් බව ඒ හදු වූ සැකයක්ම මට එදා සිහිකර දුන්නා මතක ය. ඒ මුලු කාමරයට ම තිබුණේ බිත්තියේ එල්ලන ලද එකම එක පිනූතරයක් පමණි. එය අර්ධහිසක කම සහ අසාර්ණකම පුදර-ශිනේ දෙනෙතකින් යුතු මහලු අඹෝර්ජිනල් කෙනකුගේ උඩුකය පිළිබිඹුවන රූපයකි. ඔහු සිරිටේ මුහුණ පුරා වටාගන්නා ලද රැවුලකින් ද හිරාවරණය වූ උඩුකයකින් ද යුක්තවය. එය ඉතා දක්ෂ ලෙස පිනූතාරු කරන ලද අති විශාල රූපයකි.

''ඔය ට්‍රයිබල් ඇඹොරජිනල් කෙනෙක්...''

ඒ කතාකලේ අඟේ මවයි. මා අෑ දෙස බැලුවේ කුතූහලයෙනි. මගේ කුතූහලය දුටු



අය ඒ ගැන දිගටම කතා කරන්නට වීය.

''මේ කාන්තාරය මැද ඉඳලා හොයාගත්ත අන්තිම පරවේනික ඇඹොර්ජිනල් කෙනෙක්. ඔවුන්ගේ පපුවෙ පුළුස්සලා තියන ඉරිවලින් තමයි මවුන්ගේ ප්‍රවේනික ගෝත්‍රය නිරූපනය වෙන්නෙ. ඇදළේ-පුන්ස්වල ඉඳලා තමයි මේ අවසාන ට්‍රයිබල් ඇඹෝර්ජිනල්ව හොයාගෙන තියෙන්නේ..... ඕකට ඇඩිබැක්ටිම නිසා පස්සේ කාලයක නාස්ති, උනාට හරම ලස්සන මනුස්ස කණ්ඩායමක් තමයි ඒ.....''

මම ඔවුන් ගැන පුදුම වුනෙමි. ඒ සුදු මව, තම ගෝත්‍රික ගත හොඳකේක් ගුලු මා ගැන මෙන්ම ඒ ඕස්ට්‍රේලියාවට පරවේනික ඇඹෝර්ජිනල්වරුන් ගැන ද හිතන්නේ අන්වැදල් අල්ලා ගැනීමට තරම් වග සුහදශීලී හැසිමකින් හොවන්නේ ඒ..... අඟේ මව, පියා මෙන් හොව පරම්පරා ගණනක ඕස්ට්‍රේලියාවට කිසිම්ම කරගත් පවුලකින් පැවත වග බව ටාහනා පසු දිනක පැවසුවා මට මතකය.

කීම් ඕස්ලි දේශන ශාලාව තුළින් සිසුන් පිරිසක් පිටතට එනවා මම දුටිමි. ටාහනා හෝ මහේල හෝ ඔවුන් අතර සිටිනවාද යන්න ගැන මම විමසිසිමක් වුණෙමි. මහේල මේ ඕමේ කොතැනක හෝ සිටිමට බොහෝ දුරට ඉඩ ඇත. ඔහු මා සමග ප්‍රකාශිය සඳහා අවශ්‍ය සියලු විෂයන් සම්පූර්ණ කරගත්තේ නැත. ඔහුට ඒ සඳහා කිසිම අවශ්‍යතාවයක් වූයේ ද නැත. නමුත් ටාහනා කොහේ කුමක් කරනවාදැයි කවුරුන් දකිත් ද?

''ලහිරු.... ඔයා ආපහු ලංකාවට ගියහම මොනවද කරන්නෙ''

''මම දන්නෙ නැහැ'' එක්තරා දිනයක මා ටාහනා හැකු ප්‍රශ්නයට පිළිතුරු දුන්නේ නොසැලකිල්ලෙනි.

''මට අවස්ථාවක් ලැබුණොත් කවදාහරි ලංකාවට යන්න ආසයි මම''
''හ්ම්....''
එදා මීට වඩා සැලකිල්ලකින් අෑ සමග කතා බහ කළා නම් මා තුළ පසෙං නැගී ඇති ප්‍රශ්නයට පිළිතුරු මීට වඩා පහසුවෙන් මට සපයාගත හැකියි තිබුණා හොවේ ද?

හුන් තැනින් හැඟී සිටි මම කැත්ටීමේ දෙසට ඇවිද ගියෙමි. කැත්ටීමේ පැත්තක් ම මේ වනවිටත් වසා දමා ඇත. ''ඒෂියන් කෝහර්'' මා ඉහළින් ඇති නාම පුවරුව කියවුවෙමි. එය කවදත් දෙක පමණ වන ඒට වසා දමයි. මේ පැණින්, තල ඇටත්, මීරසුත්, දවටා කුකුළු මස් බැදපු තනා තිබූ දිගයට වානය අප සමඟ ආසාවෙන් බත් කන අයුරු මට මතකය. ඒ ඇඟේ ප්‍රියතම කෑමකි. කෝපි කෝප්පයක්වත් ඕනට තරම් උන්හදුවක් මා තුළ නොමැති වූයෙන් මම ආපසු හැරුණෙමි.

''මේ මට හුරුපුරුදු වූ සියල්ල හුහුරු බවක් මා තුළ ඉතිරිකර දෙන්නේ ඇයි?'' යන පැණයට පිළිතුරු මා වෙත නොමැත. මා ගෙදර දී ඇත්වීන්දේ ද මෙවැන්නක් ම ය. එහි දී මට කිසිම හරිහරවක් නොපෙනී ගිය බැවින් මම මේ ගමන පැමිණියෙමි.

කැත්ටීමෙන් පිටවූ මම මගේ සුපුරුදු අධ්‍යාපන පීඨය දෙසට ඇවිදැ ගියේ බලාපොරොත්තු සහගත හැඟීමකින් යුතුව ය. ඔට දැනෙන මේ හුදකලාවෙන් මා මිදිය යුතුව ඇත. එහි සිට පුස්තකාලය දෙසට ඇවිදැ යන ඇඩමී දුටු මට ඇති වූයේ අධික ප්‍රීතියකි. කැසඩාවා නිජර්මම කරගත් ඔහු පරීක්ෂණ සහායකයෙකු ලෙස ලබාගෙන තිබූ රැකියාව හේතුවෙන් වසර කිහිපයක් මෙහි නැවතී සිටින බව මට දිනක් පැවසුවා මතකය. මට ඇඩමී මුණගැසුණේ මගේ හිඩන්ධනවරයෙකු ලෙස ය.

''ඇඩමී...'' මම හඬහඟා හඬගැසුවෙමි.
''ලහිරු....'' ඔහු පුදුම වෙමින් ගමන නවතා මා වෙනුවෙන් ප්‍රමාද වීය.
''කවදද ලහිරු ආවේ?''
''දැන් දවස් දෙකක් වෙනව....
පුස්තකාලයට ද ඇඩමී යන්නේ...''

''මම යන්නෙ කෝපි එකක් බොන්න... ඇතැලෙ තියන කඩේට... යමු මාත් එක්ක''

ඔහු අතේ ගිටාරය ඇත. සෑම සිකුරාදාවක ම ඔහු ගිටාර වාදනය සඳහා පුහුණුවට යන්නේ සමාර් ද සමඟය. සමාර් ඉන්දියානු ජාතික ඉතා සුහදශීලී තරුණයෙකි. සමාර් මෙහි සිටින්නේ ඔහුගේ ආචාර්ය උපාධිය වෙනුවෙනි.
''කෝ සමාර්''
''මිහිහ තවම පරිගණකය ළඟ.... මෙතනට එයි වැඩ ඉවර උනහම....''

සමාර් යන්නේ තබ්ලා වාදනය ඉගෙන ගැනීමට ය. ඔහුට ඇස්තෙන් ම දානවමත් එය හොඳින් වාදනය කිරීමේ හැකියාවක් ඇති බව මම දනිමි මා ඇඩමීට හිතවත් වූයේ සමාර් නිසාය.
පුස්තකාලා හොඩකැයිලි මැදිකර තිබූ මැද මිදුලේ යන්නේ යට ඇති රවුම් මේසයක් දෙපස අපි දෙදෙනා වාඩිවීමු. සමාර් එන තෙක් අපි බොහෝ දේ කතා කළෙමු. හමුත් මම පැමණ ඇති ගමනේ අරමුණ පිළිබඳව ඔහු ප්‍රශ්න කරන්නට ගියේ නැත. ඔහු එසේ නොකරන බව මා දැනසිටියෙමි. මගේ කෝපි කෝප්පයේ අඩක් නිමවී ඇත.

ප්‍රබන කලාපයට

දේශපාලුන වාසි බලාගෙන අපි ආණ්ඩු හදන්නෙ නෑ.
කෑගල්ල පිස්ත්‍රික් එපාප මන්ත්‍රී කබීර් හෂීම්
ලංකාදීප
ඇත්ත කෝන්නං..... අපි ආණ්ඩු හදන්නං ආර්ථික වාසි බලාගෙන ඒතරයි කෝද මන්ත්‍රී තුමා.....

.....

අල්ලස් කොමිසමේ පොලිස් පරීක්ෂකට ඇඩෙන්න ආවිත්. . . **ලංකාදීප**
අපරාත් ඇඩෙනවා..... අල්ලස් කොමිස-මට අතුල නොවෙන මෝරං කරන වැඩ දැකලා.....

.....

කුරේ යළි බස්නාහිර මඟ ඇමති.
ලංකාදීප
ලැජ්ජා නැති කම මඟ ඇමති කමටත් වඩා ලොකුයි කිව්වලු

.....

පොලිස් ලොක්කන්ට එරෙහි අල්ලස් පැමිතිය පරීක්ෂා කිරීම කඩිනම් වේ.
ලක්වීම
මොනවා....! අපේ පොලිස්සියේ අය අල්ලස් ගන්නවා...! පිස්සු කතා කියන්න එපා.....

.....

හැත්තෑය හතේ එපාප ආණ්ඩුවට වඩා ශක්තිමත් ආණ්ඩුවක් රනිල් වික්‍රමසිංහ හුදෑරද දිනකදී පිහිටුවනවා.
වජිර අබේවර්ධන.
ලක්වීම
අරාබි හිසොල්ලාසයේ පිටුවක් ද කොහෙද.....

.....

සන්ධාන රජයක් පිහිටුවා ගැනීම ඉඟරු දීලා මිරිස් ගත්තා වගේ වැඩක්.
සෝමවංශ අමරසිංහ
ලංකාදීප
ඉතින් සමහර අය ඔය බණේ කාල් ඇතිව කිව්වහම කසෝදරවරයන්මනෝ ඒ අයට බැණ වදියෙන...

.....

කාන්තාවන්ට වැඩියෙන්ම සැසඳෙන පක්ෂය එපාපය යි රනිල් වික්‍රමසිංහ
ලංකාදීප
නැත්නම් නැත්නම්.... කාන්තාවන්ගේ ඇඳුම් ගලවලා පාරවල් දිගේ ඇවිද්දෙව්වොත් එපාපයම හොවෙන්නම්

.....

රනිල් වන්ඩොව් බලයි
ලක්වීම ඉරිදා සංලකය
වඩදිදාගා නොවේ ඕන්න දැන් නම් පරිස්සම් වෙන්න වෙයි.

.....

Biographer says he fell in love with Chandrika
The Academic
පරිස්සමින් මහත්තයෝ... අපටත් වුණේ ඔය සංගෙඩියම තමයි ... අපිත් උන්දැට ආදරේ කළානෙ...